# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2050/41 – 2017 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා – 2017.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 01

2015 ජනවාරි මස 19 දිනැති අංක 1898/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

1. **7.3.2.3 වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.**

   7.3.2.3 පළපුරුද්ද

   නියමිත දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කොට තිබිය යුතුය.
   (මේ යටතේ වූ පැහැදිලි කිරීම එසේම පවතිනු ඇත)

2. **7.3.2.5 වගන්තිය යටතේ සඳහන් අනු වගන්තීන්හි අවසානයට අනු අංක (iv) ලෙස පහත වගන්තිය ඇතුළත් කරනු ලැබේ.**

   7.3.2.5 වෙනත්

   (iv) නියමිත දිනට පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

3. **8.3 වගන්තිය ඉවත් කර පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.**

   8.3 පවත්වන බලධරයා - විභාග කොමසාරිස් ජනරාල් හෝ පත්වීම් බලධාරියා විසින් බලය පවරන ලද ආයතනයක්

4. **10.3.1.1 ඡේදයේ (අ) (iii) වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.**

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමත් සේවයේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම.

5. **10.3.1.2 ඡේදයේ ඉවත් කර පහත ඡේදය ආදේශ කරනු ලැබේ.**

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය

අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% ක ප්‍රමාණයකට අදාළ පත්කිරීම් කරනු ලබන්නේ සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මතය. සීමිත තරඟ විභාගය සමත්වීම සඳහා විභාගයට අදාළ එක් එක් විෂයන්ට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතුය. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත්කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතික පරීක්ෂා කිරීම සඳහා පමණක් වන අතර එහිදී ලකුණු දීමක් සිදු නොවේ. (විෂය නිර්දේශය සහ ලකුණු ලබා දීමේ පටිපාටිය 09 ඇමුණුමේ දැක්වේ.)

6. **10.3.2.2 ඡේදයේ ඉවත් කර පහත ඡේදය ආදේශ කරනු ලැබේ.**

10.3.2.2 උසස් කිරීමේ ක්‍රමය

අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% ක ප්‍රමාණයකට අදාළ පත්කිරීම් කුසලතා පදනම මත සිදු කරනු ලැබේ. මේ සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අභියෝගතා පරීක්ෂණයකට මුහුණ දී එක් එක් විෂයන්ට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා සමත් විය යුතුය. එහි ප්‍රතිඵල මත හා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් ජ්‍යෙෂ්ඨතාව හා පළපුරුද්ද පදනම් කරගෙන දෙනු ලබන ලකුණුවල එකතුවේ අනුපිළිවෙළ අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ. බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන මණ්ඩලයක් ඉදිරියේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය. එම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දෙනු නොලැබේ.

(ඇමුණුම 10)

7. **ඇමුණුම 04 යටතේ ඇති ''සටහන'' කොටස වෙනුවට පහත සඳහන් කොටස ඇතුළත් කරනු ලැබේ.**

*සටහන 01*

බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ iii ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉමට අදාළ පරිගණක පරීක්ෂණයෙන් පහත අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන් නිදහස් කරනු ලැබේ.

01. පහත ආයතනවලින් ලබාදෙන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ දැක්වෙන පරිගණක පාඨමාලාවේ විෂය නිර්දේශයට සමාන විෂය නිර්දේශයක් යටතේ ඇති පරිගණක පාඨමාලා හදාරා ඇති නිලධාරීන්

   *a.* ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
   *b.* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
   *c.* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
   *d.* කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල මගින් පවත්වනු ලබන පාඨමාලා
   *e.* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාල හෝ වෙනත් ආයතන
   *f.* ජාතික තරුණ සේවා සභාව

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යා උපාධිය හෝ උපාධිය සඳහා පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදරා ඇති නිලධාරීන්

සටහන 02

මෙම සංශෝධන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කරන දින සිට වසර 02ක කාලයක් දක්වා අංක 1898/5 හා 2015.01.19 දිනැති බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ ඇමුණුම 04 හි සටහනේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් ද පරිගණක පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

කේ. සී. ලෝගේස්වරන්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2017 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
5 වන මහල,
අංක 109 රොටුන්ඩා ගොඩනැගිල්ල,
ගාලු පාර,
කොළඹ 03.

01 - 222

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.